# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2267/4 - 2022 පෙබරවාරි මස 14 වැනි සඳුදා - 2022.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදනය

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු සංශෝධිත නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 184 (1) වගන්තිය යටතේ කරනු ලබන නියමය**

අම්බලන්ගොඩ නගර සභාවේ සභික මන්ත්‍රීවරයෙකු වන ගංගේ සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතාට එරෙහිව ඉදිරිපත් කරන ලද පැමිණිල්ලේ චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඔහු විසින් අම්බලන්ගොඩ නගර සභාවේ සභිකයෙකු වශයෙන් සංශෝධිත නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 184(1) වගන්තියේ සඳහන් වැරදි කිසිවක් සිදුකොට ඇත්තේ ද යන්න මාස 03ක කාලයක් තුළ වාර්තා කිරීම සඳහා මා විසින් අංක 2260/47 හා 2021.12.29 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රය මගින් පත් කරන ලද ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් සිදුකර පැමිණිල්ලේ සහ වගඋත්තරකරුගේ සාක්ෂි ලේඛන සහ ලිඛිත සැල කිරීම සලකා බැලීමෙන් අනතුරුව සිය නිරීක්ෂණ හා නිගමන සහිතව මා වෙත භාර දී ඇති 2022.02.10 දිනැති අවසන් වාර්තාව ප්‍රකාරව,

ගංගේ සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා අම්බලන්ගොඩ නගර සභාවේ සභිකයෙකු වශයෙන් එකී ධුරයේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේ දී, සංශෝධිත නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184(1)(ආ) හා (ඉ) වගන්තිවල සඳහන් වැරදි සිදුකර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට මා සෑහීමට පත්වූ හෙයින්,

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184(1)(ii) සහ 184(1ආ) (ආ) වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාත් ආණ්ඩුකාරවර ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ වන මම අම්බලන්ගොඩ නගර සභාවේ සභික ගංගේ සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා 2022.02.11 වැනි දින සිට අම්බලන්ගොඩ නගර සභාවේ සභික ධුරයෙන් පහ කරමි.

තව ද, විවිධ පනත් මගින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට දකුණු පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයාට හා අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම්වරයාට මෙයින් නියම කරමි.

**ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ,**
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

2022 පෙබරවාරි මස 11 වැනි දින,
පහළ ඩික්සන් පාරේ පිහිටි,
දකුණු පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 02- 0466